**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2017**

**-------------------------------------------------**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ("මණ්ඩලය") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 31 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (ඇ) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 ඔක්තෝබර් 01 වන දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI – 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**------------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (ශ්‍රී. ලං.ගි.ප්‍ර.) අනුකූල වීම**

**--------------------------------------------------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.01 -මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**: - සමුච්චිත අරමුදලින් ඍජුව අඩුකරන ලද, මහා ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැළසීම වෙනුවෙන් දරන ලද වියදම් ආශ්‍රිත ගිණුම්කරණ ප්‍රතිපත්ති, ස්වභාවය සහ තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 - දේපල, පිරියත හා උපකරණ**: - මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් මිලදී ගන්නා ලද වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි. කෙසේ වුවද, අපහරණය කරන වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය කිරීම රු. 7,866,369 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24- සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම-:**සම්බන්ධිත පාර්ශවයන් සමග සිදු කරන ලද පුද්ගලමය වශයෙන් වැදගත් වන ගනුදෙනු වල ස්වභාවය සහ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39- මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම-:** දිගුකාලීනව හිඟහිටි සේවක ණය ශේෂයන් සඳහා හානිකරණය මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණි**.**

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා කජු සංස්ථාවෙන් අය විය යුතු ශේෂයක් ලෙස රු. 209,600,000 ක මුදලක් 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.කෙසේ වෙතත්, අදාළ මුදල මණ්ඩලයට ගෙවිය යුතු මුදලක් වශයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැති අතර මෙම මුදල මණ්ඩලයට ගෙවන බවට සහතික වීමක්ද සිදුකර නොතිබුනි. එබැවින් එම ශේෂය අයකරගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විගණනයේදී සැක සහිත විය.

(ආ) ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් , හොරණ අපනයන සැකසුම් කලාපයේ (HEPZ) පිහිටි පෞද්ගලික සමාගමකින් ලද ඉඩම් පාරිතෝෂික ආදායම් මුදලක් රු. 1,410,549 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර විලම්බිත ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා විලම්බිත වියදම් ක්‍රමක්ෂය රු.1.330,929 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මීරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයට අයත් ඉදිකිරීම් කාර්යයන් 3 කට අදාළ මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු. 930,142 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ගෙවා තිබුණද, මෙම කාර්යයන් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩවල ඇතුළත් කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

**----------------------------------**

ආයුගණක තක්සේරුවට අනුව සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ වගකීම රු. 24,115,267 ක් වුවද, එය රු. 25,054,316 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එබැවින් රු. 939, 049 ක් වූ පැහැදිලි නොකළ වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

**ලැබිය යුතු මුදල්**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල රු.594,291,216 ක් වූ අතර ඉන් රු. 279,622,328 ක මුදලක් හෙවත් සියයට 47 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. එසේම, ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදලින් හානිකරණය සඳහා ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුළු මුදලින් සියයට 59 ක් නියෝජනය කර තිබුණි.

**(ආ)** 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික ගාස්තුව රු.252,766,237 ක් වූ අතර ඉන් රු.156,034,986 ක් හෙවත් සියයට 62 ක් වර්ෂ හතරකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. ඒ අතර, සමාලෝචිත වර්ෂය තුළ එම මුදලින් රු.221,713,312 ක් හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණු අතර එය 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුදලින් සියයට 88 ක් නියෝජනය කර තිබුණි.

එසේම, ලැබිය යුතු වාර්ෂික ගාස්තුව සඳහා වූ මුළු හානිකරණය සඳහා ප්‍රතිපාදනයෙන් රු.201,646,285 ක් හෙවත් සියයට 91 ක් අවලංගු කරන ලද ව්‍යාපෘති 529 කින් වසා දැමූ ව්‍යාපෘති 151 කින් සහ මෙහෙයුම් අත්හිටුවන ලද ව්‍යාපෘති 75 කින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය.

සමාලෝචිත වර්ෂය තුලදී හානිකරණය සඳහා වූ රු 349,670,032 ක මුළු ප්‍රතිපාදනයෙන් රු. 262,358,801 හෙවත් සියයට 75 ක් 2017 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද , වසා දැමුණු සහ මෙහෙයුම් අත්හිට වූ ව්‍යාපෘති සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනයෙන් නියෝජනය විය.

(ඇ) වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ හතකට අධික කාලයක සිට අය නොවී පැවති අතර එම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(ඈ) වෙනත් ණයගැතියන් යටතේ දැක්වෙන රු.507,650 ක මුදල් ඌණතාවයක් වර්ෂ දහහතරකට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට රු.281,357,610 ක් වූ මුළු වෙනත් ණයගැතියන්ගේ වටිනාකමින් රු.253,346,759 ක් හෙවත් සියයට 90 ක් රජයේ අමාත්‍යාංශ සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය. රජයේ ආයතනවලින් ලැබිය යුතු රු.37,680,103 ක් වසර 4 ට වැඩි කාලයක් අය නොවී පැවතුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.. විස්තර පහත දැක්වේ.

| ආයතනයේ නම | 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල |
| --- | --- |
| | රු. |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 37,412,573 |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | 141,950 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 125,580 |
| එකතුව | 37,680,103 |

ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල වසර දහයකට වැඩි කාලයක් අය නොවී පැවතුණි., කෙසේ වුවද , 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් රජයේ ආයතන වලින් අයවිය යුතු වසර 4 කට වඩා හිඟව පැවති ශේෂයන් මත මූල්‍ය ප්‍රකාශනවල සියයට 100 ක හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට රු.5,766,335 ක් වූ අයකර ගත නොහැකි මුළු සේවක ණය ශේෂයෙන් රු.3,202,582 ක් හෙවත් සියයට 55 ක් වසර 4 කට වැඩි කාලයක් අය නොවී පැවතුණි.

**ගෙවිය යුතු ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 5,913,789 ක් වූ විවිධ ණයහිමියන් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි.

(ආ) එකතුව රු.24,405,234 ක් වූ රඳවාගැනීම් මුදල් වලින් කොන්ත්‍රාත් 16 ට අදාළ රු.7,897,111 ක් හෙවත් සියයට 32 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඇ) එකතුව රු.10,313,595 ක් වූ ඉදිරි ලැබීම් වර්ෂ තුනකට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

---

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වයද ඇතිව අදාල අමාත්‍යවරයා විසින් ලබාදුන් අනුමැතිය රහිතව 2017 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 6,807.75 ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 770 (2) | ගණන් දීමේ නිළධාරියාගේ අනුමැතිය රහිතව රු.3,113,255 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කර තිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | මණ්ඩලය විසින් " ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ආයෝජන මණ්ඩලයේ දායකත්වය" යන තේමාව යටතේ ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික සමාගම් දෙකකට රු. 7,630,000 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 13(2) (ආ) වගන්තිය සහ 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමෙන් තොරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගැනීමෙන් පසු එකතුව රු.512,809,119 ක් ක් වූ දීමනා 7ක් මණ්ඩලය විසින් එහි කාර්ය මන්ඩලය වෙත ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන කාර්යසාධන ගෙවීම් දීමනාව ගණනය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අධීක්ෂණය හෝ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 11 දිනැති අංක පී.ඊ.ඩී. 03/2017 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, මණ්ඩලය විසින් ස්ථිර සේවකයන් සඳහා එක් සේවකයෙකුට රු.45,000 ක් හෝ එක් මසක වැටුප යන දෙකෙන් වැඩි වටිනාකමද, අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් සඳහා රු.45,000 ක් බැගින්ද රු.58,649,750 ක් වූ වාර්ෂික ප්‍රසාද දීමනාවක් 2017 වර්ෂය සඳහා ගෙවා තිබුණි.එම නිසා රු.41,302,250 ක ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) පොළී අනුපාතයක් රහිත ණය වර්ග තුනක් සහ සියයට 4.2 ක පොළී අනුපාතයක් යටතේ ණය වර්ග හතක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් භුක්ති විදිනු ලබයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සේවක ණය යෝජනා ක්‍රමය මානව සම්පත් ප්‍රතිපත්ති මාලාවෙහි ඇතුළත් වන අතර 2007 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක වේ. මණ්ඩලය විසින් මෙම ප්‍රතිපත්ති මාලාව සඳහා 2014 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් ,ණය යෝජනා ක්‍රමය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ක්‍රියාත්මක වන අතර , 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු. 724,855,208 ක් විය.

(ii) මීට අමතරව, 1994 අගෝස්තු 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. ඒ අනුව, ඕනෑම නිවාස කටයුත්තක් සම්බන්ධයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවකින් හෝ ණය සපයන ආයතනයකින් ණය ලබාගත් සේවකයෙකුට සත්‍ය වාර්ෂික ණය පොළිය සහ සියයට 20.5 ක් දක්වා උපරිම සීමාවකට යටත්ව සියයට 4.2 ක පොළිය අතර වෙනස ප්‍රතිපූර්ණය කරනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ඉහත ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.42,122,777ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.827,183,067 ක බදු පූර්ව අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අතිරික්තය රු.768,128,696 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.59,054,371 ක වර්ධනයක් දැක්වුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී අයභාරය සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.106,717,261 කින් සහ රු.114,654,560 කින් වැඩිවීමට ප්‍රතිරූපීව මුළු වියදම රු.162,317,450 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්ය සාධනය

-------------------

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමේ ප්‍රගතිය පහත දැක්වේ.

(අ) **ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති වල ප්‍රගතිය**

--------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ පහ සඳහා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම් අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| --------- | ---------------- | ----------------- | ----------------- | -------------- | ------------- |
| 2017 | 103 | 66 | 7 | 7 | 148 |
| 2016 | 185 | 73 | 7 | 10 | 78 |
| 2015 | 157 | 100 | 5 | 27 | 23 |
| 2014 | 160 | 101 | 0 | 15 | 56 |
| 2013 | 147 | 108 | 3 | 16 | 122 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුලදී ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 44 කින් අඩු වී තිබුණි.

(ii) වර්ෂ 2013 සිට 2017 දක්වා කාල පරිච්ඡේදය තුළ වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවෙහි කැපීපෙනෙන අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) **ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන**

-------------------------------------------------

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන (FDI) පහත දැක්වේ.

| වර්ෂය | 2014-2016 සහ 2017-2020 සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ඉලක්කය එ.ජ.ඩො. මිලියන | සත්‍ය ඉටුකර ගැනීම් එ.ජ.ඩො. මිලියන | සත්‍ය ඉටුකර ගැනීම් වාර්ෂික ඉලක්ක වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ------- | ------------------- | ------------------ | ---------------------- |
| 2017 | 1,000 | 1,710 | 171 |
| 2016 | 5,000 | 801.00 | 16 |
| 2015 | 3,500 | 969.66 | 28 |
| 2014 | 2,500 | 1616.26 | 65 |
| 2013 | 1,391 | 1,391.40 | 100 |

2017-2020 කාල පරිච්ඡේදය සඳහා මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විදේශ සෘජු ආයෝජන (FDI) ඉලක්කය අසාමාන්‍ය ආකාරයෙන් ස්ථාපිත කර තිබුණු අතර පසුගිය වර්ෂයේ ඉලක්කයට සාපේක්ෂව එය සියයට 20 ක් පමණක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා සත්‍ය ඉටුකර ගැනීමෙහි කැපීපෙනෙන වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සහ වතුපිටිවෙල අපනයන සැකසුම් කලාපය තුල පිහිටි නළ ළිඳ මගින් සැපයෙන ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කලාපයේ පිහිටි ව්‍යාපාර වලට අවශ්‍ය ජලය මණ්ඩලය විසින් කුලියට ගත් බව්සර මගින් සපයා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ජලය ඝන මීටරයක පිරිවැය රු.395 ක් විය. කෙසේ වෙතත් , මණ්ඩලය විසින් ව්‍යාපාර වලට සපයන ජලය ඝන මීටරයක් සඳහා රු. 75ක් පමණක් අය කර තිබුණි. එබැවින් , රු. 5,280,320 ක අලාභයක් දැරීමට මණ්ඩලයට සිදු වී තිබුණි. එසේ වුවද, මණ්ඩලය විසින් අලාභය අවම කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් 2018 ජුනි 30 දක්වාත් හඳුන්වා දී නොතිබුණි.

(ආ) සීතාවක, කොග්ගල සහ කටුනායක අපනයන සැකසුම් කලාපයන්හි පිහිටි වර්ග අඩි 53,667 ක විශාලත්වයකින් යුතු පරිශ්‍ර පනස් නවයක් රු. 17,207,076 ක වාර්ෂික කුලියක් යටතේ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව භාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණි.

(ඇ) ආයෝජන මණ්ඩල ගාස්තු හා අයකිරීම් සංශෝධනය කිරීමේ ප්‍රතිපත්තිය සැකසීමට හා විධිමත් කිරීමට සහ මණ්ඩලයට අයත් සියළුම ආදයම් නියමාකරයෙන් අය කරගන්නා බවට තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයට අය වියයුතු අදායම් අහිමි වීමේ අලාභය දැරීමට සිදු වී ඇත.මේ පිළිබඳ සිදුකරන ලද විගණන පරීක්ෂාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ආයෝජන මණ්ඩල ගාස්තු හා අයකිරීම් මණ්ඩලයේ ගාස්තු කමිටුවක් මගින් නිර්දේශ කරනු ලබන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරනු ලැබේ.ඉන් පසු මෙම ගාස්තු ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.කෙසේ වෙතත්, බොහෝ අවස්ථා වලදී, යෝජිත ගාස්තුව හෝ අයකිරීම තීරණය කිරීම, ගාස්තු කමිටුව විසින් පවත්නා ගාස්තුවට හෝ අය කිරීමට යම්කිසි මුදලක් එකතු කිරීමෙන් හෝ අදාල අපනයන සැකසුම් කලපයේ ප්‍රධාන නිලධාරියා විසින් යෝජනා කරන සංශෝධිත ගාස්තුව හෝ අයකිරීම ගාස්තු කමිටුව විසින් අනුමත කිරීමෙන් හෝ සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, පවත්නා ගාස්තුවට හෝ අය කිරීමට එහතු කරන මුදල තීරණය කිරීමේ ක්‍රමය හෝ ගාස්තුව හෝ අයකිරීම සංශෝධනය කිරීමේ පදනම විගණයට අනාවරණය නොවීය.

(ii) සීතාවක අපනයන සැකසුම් කලාපයේ පිහිටි පරිපාලන ගොඩනැගිල්ලෙහි බිම්මහලේ කොටසක් 2003 වර්ෂයේ සිට ලංකා බැංකුවට කුලී පදනමින් ලබා දී තිබුණි. 2003 -2014 කාල පරිච්ඡේදය සඳහා වර්ග අඩියකට රු. 30 ක ගාස්තුවක් අයකර තිබුණු අතර 2016 ජනවාරි 01 දින සිට එය වර්ග අඩියකට රු.45 ක් වශයෙන් සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, කුලී මුදල තීරණය කිරීමේ පදනම විගණනයට ඉදිරිපත් නොවීය. එසේම, මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ලංකා බැංකුව සමග ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණු බවද අනාවරණය විය.

(iii) රජයේ තක්සේරු කරුගේ වාර්තාවට අනුව සෑම වසර තුනකට වරක් බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, කටුනායක අපනයන සැකසුම් කලාපයට අයත් ඇවරිවත්ත බස් නැවතුමෙහි පිහිටි කඩකාමර 15ක සහ බේස්ලයින් පාරට මුහුණ ලා පිහිටි කඩ කාමර 04 ක බදු කුලිය 2009 වර්ෂයේ සිට වර්ෂ අටකට වැඩි කාලයක් තුළ සංශෝධනය කර නොතිබුණි.

(iv) මණ්ඩලය සහ මහනුවර කාර්මික උද්‍යානයෙහි පිහිටි පෞද්ගලික බැංකු ශාඛාවක් අතර වූ 2004 සැප්තැම්බර් 02 දිනැති ලිඛිත ගිවිසුම ප්‍රකාරව, වාර්ෂික බිම් කුළිය සෑම වසර තුනකටම වරක් සංශෝධනය කළ යුතුය. කෙසේවෙතත් , ගිවිසුම ප්‍රකාරව බිම් කුළිය සංශෝධනය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ලංකා බැර කර්මාන්ත සහ ඉදිකිරීම් සමාගම වශයෙන් හැඳින්වූ ලංකා වානේ සංස්ථාව අතුරුගිරියේ පිහිටි කර්මාන්ත ශාලාව නවීකරණය කිරීම සහ හා වැඩිදියුණු කිරීම සඳහා 1998 මැයි 07 දින මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. පසුව, 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ එවකට පැවති කර්මාන්තශාලාව නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා 2011 ජූනි 03 වන දින පරිපූරක ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාගම විසින් එකඟ වී ඇති පරිදි අතිරේක නිෂ්පාදන පරාසයක් හඳුන්වා දී නොතිබුණි.

(ii) 2015 වන විට පවතින නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 250,000 ක් දක්වා ඉහළ නැංවීමට එකඟ වී තිබුණු නමුත් සමාගමෙහි නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 250,000 ක් දක්වා ඉහළ නංවා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | නිෂ්පාදන ධාරිතාවය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2011 | 78,847 |
| 2012 | 138,197 |
| 2013 | 132,765 |
| 2014 | 181,417 |
| 2015 | 169,521 |

(iii) මණ්ඩලය විසින් සමාගම වෙත දස අවුරුදු බදු විරාමය, ආනයන බදු සහන හා රේගු තීරු බදු නිදහස් කිරීම් වැනි සහන ලබාදී තිබුණද, පරිපූරක ගිවිසුමේ නියමයන් හා කොන්දේසි ඉටුකිරීම සම්බන්ධයෙන් නිරන්තර අධීක්ෂණයක් සිදු කිරීමට මණ්ඩලය අසමත් වී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.3.1 අපනයන සැකසුම් කලාප (EPZ), කාර්මික උද්‍යාන (IP) සහ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක කිරීම

අධික පරිපාලන පිරිවැය හේතුවෙන් පහත සඳහන් අපනයන සැකසුම් කලාප වර්ෂ කිහිපයක් මුළුල්ලේ අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

**වර්ෂය සඳහා බදු පෙර අතිරික්තය ( ඌණතාවය )**

| කලාපයේ නම | 2017 | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ |
| කොග්ගල අපනයන සැකසුම් කලාපය | (12,547) | (10,903) | (47,108) | (40,781) | (14,050) | (11,775) |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | (16,911) | (9,062) | (3,323) | 777 | (2,969) | (7,767) |
| මල්වත්ත අපනයන සැකසුම් කලාපය | (4,824) | 0.2 | (1,914) | (4,376) | (2,748) | (5,531) |
| මිරිජ්ජවිල කාර්මික උද්‍යානය | (16,044) | (4,828) | 1,256 | (8,384) | 6,334 | 0.5 |

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

---------------------------

අපනයන සැකසුම් කලාපයක් (EPZ) වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා 2004 ජනවාරි 23 වන දින කැරගල පිහිටි ඉඩමක් මණ්ඩලය විසින් අත්පත් කරගෙන තිබුණු අතර කලාපයේ ස්ථාපිත කරන කර්මාන්තශාලා වල රැකියා ලබාදීමේ අරමුණින් ඉඩම අත්පත් කරගන්නා අවස්ථාවේදී ඉඩමේ කම්කරුවන් වශයෙන් සේවය කරමින් සිටි සේවය අවසන් කල ශ්‍රමිකයන් 08 දෙනෙකු වෙනුවෙන් අපනයන සැකසුම් කලාපයක් වශයෙන් ඉඩම වැඩිදියුණු කරන තෙක් සානුකම්පිත පදනමින් රු.3,000 සිට රු.6,000 දක්වා වූ මාසික දීමනාවක් ගෙවීමට මණ්ඩලය එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීම විවිධ හේතූන් මත ප්‍රමාද වී තිබුණු අතර, ශ්‍රමිකයන් වෙනුවෙන් ගෙවූ දීමනාව අත්හිත්වීමට මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රමිකයන් 06 දෙනෙකු විසින් ඔවුන්ගේ හිඟහිටි දීමනාව ඉල්ලා මණ්ඩලයට එරෙහිව සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත පැමිණිලි කර තිබුණි. අවසානයේදී, දෙපාර්ශවයම විසින් කාර්මික ආරවුල් පනත යටතේ ආරවුල සම්බන්ධයෙන් බේරුම් කරණ එකඟතාවයකට පැමිණි අතර 2017 ජූලි 12 වන දින වන්දියක් වශයෙන් රු. 1,800,000 ක් මුදලක් ගම්පහ කම්කරු කොමසාරිස් කාර්යාලයෙහි තැන්පත් කිරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

## 4.5 වෙනත් ආයතන වලට මුදා හරින ලද සම්පත්

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති වලට පටහැනිව, මණ්ඩලයේ සේවකයන් තුන් දෙනෙකු සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2017 වර්ෂය සඳහා වැටුප් හා අතිකාල දීමනා ලෙස රු.4,629,590 ක මුදලක් වියදම් කර තිබුණි.

(ආ) එවකට ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අයත්ව තිබුණු අංක 64-5315 දරන වාහනය වසර 10 කට අධික කාලයක් මණ්ඩලය විසින් භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, මෙම වාහනය මණ්ඩලය වෙත පවරා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින දක්වාත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි. මෙම වාහනයේ නඩත්තු පිරිවැය වශයෙන් රු. 290,610 ක මුදලක් 2017 වර්ෂය තුළදී මණ්ඩලය විසින් වැය කර තිබුණි.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථාන පරිශ්‍රයේ මෝටර් වාහන ගාල් කිරීමේ අවසර පත්‍ර 12 ක් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් රු. 720,000 ක් වැයකර තිබුණි. කෙසේ වුවද , 2017 දෙසැම්බර් 31 දින වන විටත් මෙම වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) රු. 3,823,250 ක් පිරිවැය වූ මණ්ඩලයේ ස්ථාවර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ තථ්‍ය මානව සම්පත් අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනමින් සේවකයන් අනූ හයක් (96) ක් සහ හා අනියම් පදනමින් සේවකයන් එකසිය තුනක් (103) ක් බඳවා ගැනීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) හැට හතරක් (64) සහ ප්‍රාථමික මට්ටමේ සේවකයන් එකසිය විසි හයක් (126) තථ්‍ය සේවක සංඛ්‍යාවට

වඩා අතිරික්තව පැවතුණි. එසේම මෙම බඳවා ගැනීම් සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට කළමණාකරන මට්ටමේ තනතුරු නවය (09) ක් වැඩ බැලීමේ පදනම මත පුරවා තිබුණි. එසේම, 1997 ඔක්තෝබර් 24 දිනැති මුදල් හා සැළසුම් කිරීමේ අමාත්‍යාංශයේ අංක 124 දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, පුරප්පාඩු වූ තනතුරක වැඩ ආවරණය කිරීම මාස තුනක කාල පරිච්ඡේදයකට සීමා විය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දින වන විට නිළධාරීන් 08 දෙනෙකු මාස 06 සිට මාස 51 ක් දක්වා වූ කාල පරාසයක් වැඩ ආවරණය කිරීම සඳහා යොදවා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් සඳහා අනුක්‍රමික සැලැස්මක් 2017 දෙසැම්බර් 31 දින දක්වාත් පිළියෙල කර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

-----------------------------------------------

වසර 2015 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සාමාජික රටවල් පලකල එකඟතාවය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම එක්සත් ජාතීන්ගේ “වසර 2030 න්‍යාය පත්‍රය” ප්‍රකාරව තම කාර්යයන් ඉටු කළ යුතුය. ඒ අනුව, මණ්ඩලය විසින් එහි එදිනෙදා කාර්යයන් වලට අදාල අරමුණු වශයෙන් අරමුණු 08,09 හා17 හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ඉලක්ක හා එම ඉලක්ක ළගා කර ගැනීමට අදාළ සංධිස්ථානයන් සහ එම ඉලක්ක ඇගයීමට අදාල දර්ශක මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 6.1 ක්‍රියාකාරි සැලැස්ම

---------------------

2017 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රියාකාරි සැලැස්ම මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුකූලව සකස් කර නොතිබුණි.

(ii) සැළසුම්ගත ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමට හැකි වන ආකාරයේ ප්‍රතිදාන සහ දර්ශක ස්ථාපිත කර නොතිබුණි.

(iii) 2017 වර්ෂය තුළ නිමකිරීමට සැළසුම් කරන ලද රු. මිලියන 219.65 ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් තිස් එකක් ක්‍රියාකාරි සැලැස්ම මගින් සැළසුම් කළ පරිදි සමාලෝචිත වර්ෂය තුළ නිම කර හෝ රු. මිලියන 155.3ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් තිස් හයක් ආරම්භ කර හෝ නොතිබුණි.

### 6.2 පාරිසරික හා සමාජ වගකීම

--------------------------------

මණ්ඩලයේ කාර්යයන් තුළින් පරිසරය මත ඇතිවන බලපෑම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුගත නොවීම හේතුවෙන් සීතාවක අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඇගලුම් කරමාන්ත ශාලාවක් සහ සීතාවක අපනයන සැකසුම් කලාපය පිලිවෙළින් 2013 අප්‍රේල් මාසයේ සහ 2010 දෙසැම්බර් 31 දින සිට පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා නොගෙන මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි.

(ii) 2018 ජූලි මස 06, 09 සහ 19 දින වලදී බියගම හා සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපයන්හි සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කර්මාන්තශාලා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පරිසර හිතකාමී ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එබැවින් , කර්මාන්තශාලා වල ඝන අපද්‍රව්‍ය පරිසරයට අහිතකර වන ආකාරයෙන් කලාපය තුල පිහිටි විවෘත ප්‍රදේශයකට බැහැර කරනු ලබයි.

- සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපයෙහි පිහිටි අපජල පවිත්‍රාගාරයේ පිරිසිදු කල ජලය පවිත්‍රාගාරය අසල පිහිටි පොකුණකට මුදා හරිනු ලැබේ. කෙසේ වෙතත්, වැසි කාලවලදී පවිත්‍රාගාරයේ අපජල රඳවනය ඉතිරියාමේ ප්‍රතිඵලයක් වශයෙන් අපජලය පොකුණෙහි ඇති පිරිසිදු කල ජලය සමග මිශ්‍රවී ගඟට මුදා හැරේ.

## 6.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

මණ්ඩලය විසින් 2017 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද, එය වගකිවයුතු නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණු අතර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනකට අදාල ක්‍රියාකාරකම් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හය නොඉක්මවන කාල පරාසයන් තුළ අඛණ්ඩව යාවත්කාලීන කර නොතිබුණි.

(iii) සිදු කරන ලද නියැදි පරීක්ෂාවකට අනුව, 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 31 කින් ක්‍රියාකාරකම් 28ක් සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 03 ක් මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (ආ) සමග අනුකූල නොවීය.

(iv) වර්ෂය තුළ නිම කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් එකසිය අනූ හයක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(v) 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 272.63 ක් වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විසි එකක් වසර තුළදී නිමකර නොතිබුණි.

## 6.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

---------------------

බහලුම් පරීක්ෂාව සහ ආරක්ෂක හා රේගු කාර්ය මණ්ඩලයට පහසුකම් සැපයීමේ අරමුණින් සීතාවක අපනයන සැකසුම් කලාපයේ යෝජිත ප්‍රධාන පිවිසුම් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල මූලික සංකල්පය 2011 වසරේදී ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යය ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැළසුම් කර තිබුණි. එසේම එය 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහිද ඇතුළත් විය. ප්‍රධාන දොරටුවෙහි සුදුසු ගොඩනැගිල්ලක් නොමැති වීමෙන් ආයෝජකයන්, සේවා සපයන්නන් සහ සේවකයන් අපහසුතාවයන්ට පත් වුවද , සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යෝජිත ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම ප්‍රමාදව පැවතුණි.

## 6.5 අයවැය පාලනය

---------------------

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. 6 නොවිසඳුණු විගණන ඡේද

------------------------------

(අ) සමාගමකට පවරා දෙන ලද බදු දේපල පිළිබඳ හිමිකම් හා අයිතීන් සහ එහි ගොඩනැගිලි හා එම පවරන ලද දේපළවල ස්ථිරව සවි කරන ලද සියලු පිරියත, යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම්, ත්‍රිපාර්ශවීය ගිවිසුම් අත්සන් කිරීම මඟින් කිසියම් බැංකුවක හා/හෝ ණය ලබාදෙන ආයතනයක උකස් කිරීම සඳහා මණ්ඩලය විසින් ආයෝජන සමාගම් වලට අවසර ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය පැහැර හැරීමෙන් ඇතැම් සමාගම් ඇවර කිරීම මඟින් අවසන් වී තිබුණි.

(ii) උකස් කරන ලද දේපළ වලට අදාලව නිරවුල් නොවූ ගැටළු හේතුවෙන් ඉඩම් වටිනාකම අහිමි වීම, නිෂ්කාර්ය වන ඉඩම් වල ආවස්ථික පිරිවැය සහ මණ්ඩලයට ලැබිය යුතු මුදල් ආදිය පිළිබඳ අලාභ දැරීමට මණ්ඩලයට සිදුවී තිබුණි.

(iii) හොරණ මාපුටුගල පර්ත් වතුයාය සි/ස විද්‍යෝදය ආයුර්වේද වෛද්‍ය විද්‍යාල පුද්ගලික සමාගම වෙත බදු දී තිබුණි. රු.මි. 5 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා එකී දේපල මහජන බැංකුව වෙත උකස් කර තිබුණි.තවද එකී ණය මුදල ලබාගැනීමේදී ත්‍රිපාර්ශවීය ගිවිසුමකට එළඹී නොතිබුණි. ණය මුදල ගෙවීමට අපොහොසත් වීම මත 2013 මැයි 12 දින දේපල බැංකුව විසින් දේපල අත්පත් කර ගෙන තිබුණු අතර එය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීරණය කර තිබුණි. බදු දේපල මිලදී ගැනීමට 2014 වර්ෂයේදී නව ආයෝජකයකු එකඟ වී තිබුණද, 2018 මැයි 31 දින වන තුරුත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා නව ආයෝජකයා අතර ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් පර්ත් වතු යාය මිලදී ගෙන තිබුණු අතර වතු යායෙන් කොටසක් 1999 වර්ෂයේ සිට වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ( SLSPC ) භාර දී තිබුණි. පසුව එය 2006 දෙසැම්බර් 08 දක්වා දීර්ඝ කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතු යායට අදාලව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2017 දෙසැම්බර් 31 දක්වාත් ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල හඳුනාගෙන වාර්තා කර නොතිබුණි.

(ii) එකතුව රු. මිලියන 12.42 ක් වූ මෝටර් වාහන හා බංගලා කුලිය ජංගම ගිණුම් හරහා කොන්ත්‍රාත් කරුගේ ගිණුමට අවිධිමත්ව මාරුකර තිබුණි.

(iii) මිනුම් වාර්තාවට අනුව, මණ්ඩලය විසින් මිලදී ගත් ඉඩමේ විශාලත්වය අක්කර 1563 ක් සහ පර්චස් 24.74 ක් වුවත්, මණ්ඩලයට අයත් ඉඩමේ විශාලත්වය අක්කර 1435 ක් රූඩ් 3 ක් සහ පර්චස් 25.03 ක් විය. ඒ අනුව, අක්කර 127 ක් සහ පර්චස් 39.71 ක වෙනසක් මණ්ඩලය විසින් හඳුනාගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පෞද්ගලික සමාගමක් ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇගළුම් කම්හලක් ස්ථාපිත කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සහ ඇගළුම් හා වෙනත් රෙදිපිළි අපනයනය කිරීමට මණ්ඩලය සමග 1992 අගෝස්තු 14 දින ගිවිසුමකට එළඹුණි. 1992 නොවැම්බර් 05 දින මණ්ඩලය විසින් ගිවිසුම අවසන් කර තිබුණු අතර එකඟ වූ වන්දිය යටතේ සියළු ගොඩනැගිලි සහ එහි පැවති යන්ත්‍රෝපකරණ මණ්ඩලයට පවරන ලෙස දන්වා තිබුණි. එකඟ වූ පරිදි වන්දිය ගෙවීමට මණ්ඩලය අපොහොසත් වූ බැවින්, එය ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයට යොමු කර තිබුණු අතර සම්පූර්ණ හා අවසන් නිරවුල් කිරීම වශයෙන් රු.23,835,535 ක මුදලක් ගෙවීම සඳහා 2000 අගෝස්තු 07 දින තීන්දුව ලබා දී තිබුණි. එකී මුදල ගෙවීම මත, ව්‍යාපාරය විසින් මණ්ඩලයෙන් තවදුරටත් රු.37,200,000 ක ගෙවීමක් අපේක්ෂාවෙන් බේරුම්කරණ තීන්දුවක් බලාත්මක කිරීමට බේරුම්කරණ පනතේ 31 වන වගන්තිය යටතේ එච්සී/ඒආර්බී/1254/02 දරන ඉල්ලුම් පත්‍රයක් කොළඹ මහාධිකරණයේ ගොනුකර තිබුණි. 2012 මැයි 14 දින මහාධිකරණය විසින් දුන් තීන්දුව ප්‍රකාරව රු.102,138,350 ක අතිරේක මුදලක් ගෙවීමට මණ්ඩලය වගකීමට යටත් විය. මණ්ඩලය විසින් මහාධිකරණ තීරණයට අනුකූල නොවීම හේතුවෙන් වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් රු.102,138,350 ක මුදලක් සඳහා 1431688 අංක දරන බැංකු ගිණුම භාරයට ගැනීමට 2014 දෙසැම්බර් 22 දින නියෝගයක් ලබා දී තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2015 ජනවාරි 01 දින රු.102,138,350 ක මුදලක් මහාධිකරණයේ බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. මණ්ඩලය විසින් මෙම තීන්දුවට එරෙහිව නඩුවක් ගොණු කළ අතර එම නඩුව 2017 දෙසැම්බර් 31 දින වන විටත් විභාග වෙමින් පැවතුණි.

(ඈ) මණ්ඩලය විසින් විවිධ විෂමාචාර හේතුවෙන් සේවකයකුගේ සේවය අවසන් කර තිබුණු අතර ඔහු විසින් අවසන් කිරීමේ තීරණයට එරෙහිව කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොණු කරන ලදී. කම්කරු විනිශ්චය සභාවේ නියෝගය ප්‍රකාරව, වන්දියක් වශයෙන් රු.3,627,900 ක මුදලක් 2016 අගෝස්තු 22 වන දින කොළඹ කම්කරු විනිශ්චය සභාවේ තැන්පත් කිරීමට මණ්ඩලයට සිදු විය. ඉන්පසු, මණ්ඩලය විසින් කොළඹ කම්කරු විනිශ්චය සභාව දුන් තීන්දුවට එරෙහිව අභියාචනය කර තිබුණු අතර එම නඩුව 2017 දෙසැම්බර් 31 දින වන විටත් විභාග වෙමින් පැවතුණි.

(ඉ) 2012 මාර්තු 22 දිනැති 12/356/504/045 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අධි කාර්මීකරණ කලාපයක් ඉදිකිරීම සඳහා ත්‍රිකුණාමලය, සාම්පූර්හි පිහිටි අක්කර 818 ක විශාලත්වයකින් යුතු ඉඩමක් මණ්ඩලය වෙත ලබාදීමට අනුමැතිය ලැබී තිබුණි. ඉඩම එවකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් මණ්ඩලය වෙත නොමිලේ ලබා දී තිබුණි. ඉඩම අත්පත් කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා නිවාස 1218 ක් ඉදිකිරීම වෙනුවෙන් මුතුර්හි ප්‍රාදේශීය ලේකම්වරයා වෙත රු.347,130,000 ක් වූ මුදලක් නිදහස් කිරීමට මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2014 අගෝස්තු 01 දින කොටස් මුදලක් ලෙස රු.20,000,000 ක් මුතුර්හි ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලය වෙත ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ඉඩම 2015 මැයි 07 දිනැති අංක 1913/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කල දැන්වීමක් මඟින් අවලංගු කර තිබුණි. . ගෙවන ලද මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) රු.97,937,000 ක පිරිවැයකට 2004 ජනවාරි 23 දින මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද අක්කර 122 ක් රූඩ් 01 ක් සහ පර්චස් 27.4 ක විශාලත්වයකින් යුතු මලිදූවකන්ද වත්ත නැමැති ඉඩම 2018 ජූනි මාසය අවසානය දක්වාත් කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

(උ) පිළිවෙලින් රු.1,163,958 ක් සහ රු. 917,160 ක් වූ සුනාමි සහන අරමුදල සහ පොදු රාජ්‍ය මණ්ඩල සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ලද අරමුදල් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නොවෙනස්ව පැවතුණි.

(ඡ) වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ පොදු අපජලය පිරිපහදු අංගනය වැඩි දියුණු කිරීමේ යෝජනාව 2009 වර්ෂයේදී ඉදිරිපත් විය. ඒ අනුව, අංගනයේ ධාරිතාවය දිනකට ඝන මීටර් 400 සිට ඝන මීටර් 650 දක්වා වැඩි කිරීමට තීරණය විය. ප්‍රමාණවත් නොවන ධාරිතාවය පිරිපහදු අංගනයේ මනා ක්‍රියාකාරීත්වයට සහ නඩත්තු කටයුතු වලට දැඩිව බලපෑම් කර ඇති බැවින් සහ අංගනයේ පිටවානෙහි පිරිපහදු කල අපජලයේ ගුණාත්මක ප්‍රමිතිය පවත්වාගැනීමට ඉහල ප්‍රමුඛත්වයක් දිය යුතු බැවින් අපජලය පිටවීමේ ප්‍රමාණය පවත්වාගැනීම සඳහා අංගනයේ ධාරිතාවය ඉහල නැංවීම දැඩිලෙස අත්‍යවශ්‍ය වී ඇති බව අංගනයේ නඩත්තු කටයුතු සිදු කරන සමාගම විසින් 2016 මැයි 14 දින මණ්ඩලය වෙත දැනුම් දී තිබුණි. 2016 අගෝස්තු 03 දින තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි. කෙසේ වෙතත් 2018 මැයි 31 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

( උ) මුළු පිරිවැය හා සැසඳීමේදී කාර්ය මණ්ඩල පිරිවැය වැඩි වී ඇති බැවින් ආයතනයේ කාර්ය සාධනය සඳහා සේවකයින්ගෙන් ලැබෙන දායකත්වය මත දිරිදීමනා ගෙවීමේ ක්‍රමයක් සකස් කිරීම සඳහා පියවර ගන්නා ලෙස 2017 මැයි 05 දින පැවැත් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම මගින් නියෝග කරන ලදී. කෙසේ වෙතත් , මණ්ඩලය විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝගයට අනුගත වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්** | **නිරීක්ෂණ** |
|---|---|
| පුද්ගල පඩිනඩි පිළිබඳ පාලනය | වෘත්තීය දීමනා, මාසික ප්‍රවහන දීමනා සහ ප්‍රධාන කාර්යසාධන ගෙවීම් වැනි කාර්යමණ්ඩල දීමනා සඳහා මණ්ඩලය විසින් විධිමත් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් රැස්කර ගැනීම | මණ්ඩලය විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබුණද, ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු හිඟ ශේෂයන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| ප්‍රසම්පාදන සළසුම් කිරීම | ප්‍රසම්පාදන සැළැස්ම ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙසෙ යොදාගෙන නොතිබුණි. |
| ගිණුම්කරණය | තම දේපල නිවැරදිව වර්ගීකරණය කිරීමේ ක්‍රමවේදයක් මණ්ඩලය සතුව නොතිබුණි. |